# ජුලී සහ දඬුලේනා



# ජූලී සහ දඬුලේනා

සනුල්‍යා පහන්දි දිද්දෙණිය

# ජුලී සහ දඬුලේනා

සනුලායා පහන්දි දිද්දෙණිය

කතෘ

පළමු දිගහැරීම

(සත්‍ය කතාවක් ඇසුරිනි)

මහාමායා බාලිකා විදුහල

2 ශ්‍රේණිය C

2026/ 06 / 10

ISBN :- 978 – 624 – 211 – 079 - 0

# පිදුම

ජීවිතේ

මග එළියා කරනා

මගේ අම්මාටත්, අප්පච්චීටත්,

දයාබර ගුරු මෑණිවරුන්ටත්, ගුරු පියවරුන්ටත්

සෙනෙහසින් මේ පොත

පුදමි !



# පෙරවදන

දිනෙන් දින සංකීරණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යායේ මූලිකත්වයෙන් සිදු කරණ හේමමාලා උපහාර ගත් කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ඨ ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාර ධමර් මෙන්ම නිමර්ානාත්මක ප්‍රවධර්නය වැනි බහු විධ කුසලතා සංවධර්නය අරමුණු කොටගෙන පොතේ ලියන්නට යොමු කරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩකර වූ හේම මාලාවට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සදහා නිමර්ානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තූතිය පුදකරමු.


ශශිකලා සේනාධිර,

විදුහල්පතිනිය,

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිමර්ාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිමර්ාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිමර්ාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාථර්ක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිවර්ාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාථර්කත්වයක් ලබනු ඇතැයි ප්‍රාථර්නා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචායර් , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු  දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.


ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාළිගාව
2026.05.10



එදා හරිම ලස්සන දවසක්. ලස්සනට ඉර පායලා මල්, පිපිලා, ගස්වල ගෙඩි හැදිලා තිබුණා.



ඒ ලස්සන මල්වලට මම වතුර දමමින් සිටියා.




මගෙත් එක්ක මිදුලේ ජුලී, ටීනා, ඇනීත් සෙල්ලම් කරමින් සිටියා. ඒ වෙලාවෙම දඬුලේනෙකුත් රස කර කර අඹ ගෙඩියක් කමින් සිටියා.



කකා හිටිය අඹගෙඩිය බිමට වැටුණා. ඒක ගන්න ආපු දඬුලේනාව පැනපු ගමන් ජුලී අල්ල ගත්තා. ඒක දකපු මම හොඳටම බය වුණා.



ඒ වෙලාවේ මම බයේ අඬමින් දුවගෙන ගිහින් අම්මට කිව්වා.



අම්මා ඉක්මනට ඒ දේ ගැන අප්පච්චිට කිව්වා.




අපි තුන්දෙනා එළියට එනකොටම ජූලී දඬුලේනාව කටින් අල්ලගෙන සිටියා.



ඒ වෙලාවේ අපිව දැකපු ජූලී දඩුලේනාව අරගෙන දුවන්න පටන් ගත්තා. ඒ පිටුපසින් ඇනිත්, ටීනාත් දුවගෙන ගියා.



අප්පච්චී දඬුලේනාව ජූලීගෙන් බේරගත්තා. අම්මා ජූලීව අල්ලගෙන ඉන්න කොට මමයි, අප්පච්චියි දඬුලේනාට තුවාල ද කියලා බැලුවා.



දඬුලේනාට තුවාල නැති නිසා අපි දඬුලේනාව ආයෙත් ගහක් උඩින් තිබ්බා. දඬුලේනාත් සතුටින් යන්න ගියා. එයාව බේරගත්තු නිසා අපිටත් ගොඩක් සතුටු හිතුණා.

# පසුවදන



අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පයෙර්ෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පයෙර්ෂණ කෘතියක් රචනා කරන්නට යොමු කර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාරට් ඇල්ෆා පරම්පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතු බව පයෙර්ෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආශ්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් **හේමමාලා උපහාර** ග්‍රන්ථ කරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාර ධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටු කළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මුලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද දියවඩන තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කායර් මණ්ඩලයටද මෙම සත්කායර් වෙනුවෙන් උපහාර දක්වමු.

සෙනෙවිරත්න මහලේකම්

(ව්‍යාපෘති නිරමාතෘ)

ISBN :- 978 – 624 – 211 – 079 - 0

# ස්තුතිය!

නිරතුරුව මා ළඟ හිඳිමින් මගේ සියලු දුක සැප බලන මගේ අම්මාටත්, අප්පච්චිටත් මට අකුරු කියා දී මග පෙන්වූ විදුහල්පතිතුමිය ඇතුළු ගුරු මෑණිවරුන්ටත්, පියවරුන්ටත් මා දිරිමත් කළ සියලුම දෙනාටත් මාගේ හදපිරි ස්තුතිය!